# පැරණි පුවත්පත් මතකයෙන්

1986 දිළිඳු ජනතාව ගේ ආහාර මුද්දර උදුරා ගැනීමේ ව්‍යාපාරයක් රජය ක්‍රියාත්මක කළේ ය.
මේ නිසා සෑම ගමක ම දිළින්දෝ කඩිලෙන් ලිපට වැටුණහ. ඔවුන් ගේ හඬට පුවත්පතෙහි ඉඩක් ලබා දීමට ඉදිරිපත් වූ විශේෂාංග ර චකයෙක් ඔවුනට හමු වූයේ ය.
**ඔවුන්ගේ වේදනාව ඔවුන්ගේ ම වචන වලින් පිටතට ආ අවස්ථාවක් මේ ලිපියෙන් හෙළිවේ.**

# මුද්දරයෙන් බැටකන ගැමියෝ

"දික්වැල්ල උප දිසාපති කාර්යාලයට කඩා වැදුණු ආහාර මුද්දර අහිමි වූ කෝරලේගොඩ, ගන්දර, ජනතාව 'මුද්දර නොදී අප මරා දමන්න එපා' යි කියමින් කෑ ගැසුවා. රට පුරාම මේ හඬ පැතිර යනවා. ඔවුන් සංවිධානය වී අද ' දිළිඳු සහන රැක ගැනීමේ ව්‍යාපාරය' නමින් නව සංවිධානයක් ගොඩ නගා තිබෙනවා.

දිළිඳු සහන රැක ගැනීමේ ව්‍යාපාරයේ ලේකම් තලල්ලේ එම්.ඩී. ඩැනියල් මහතා අප සමඟ කීය.

ගාල්ල, මාතර, හම්බන්තොට දිසාවල ආහාර මුද්දර අහිමි වූ ජනතා වගේ නියෝජිතයින් පැමිණ ඒ රැස්වීමට අපි සහභාගී වූයෙමු.

මිනිසුන් තුළ බුර බුරා නැඟුණු කෝපයේ ගිනිදැල් ඇවිළෙන්නේ තුස ගින්නක් සමඟ ය.

එක් අයෙකුට පමණක් කතා කරන්නැයි කීවද, ඔවුහු සියල්ලෝ ම කෑ ගැසූහ. පෙර ඔවුන් තුළ වූ සංවරය අද නැත.

එක් දැරියක සඳුළු පෙරමින් කී කතාවට අපි සවන් දුනිමු. තලල්ලේ ගෙදරවත්තේ පදිංචි ඇය අයි. පී. කරුණාවතී ය. වයස අවුරුදු පහළොවකි.

"මොන ඉස්කෝලද? අවුරුදු දොළහෙ දී මම ඉස්කෝලෙන් අස්වුණා. අපි අන්තිම දුප්පත්. තාත්තා බක්කරේ කෙනෙක්. දැන් පපුවේ අමාරුව හැදිලා ඇඟේ ලේ නැතුව ලෙඩුන්දර ගිහින් බේත් විඳිනවා. අම්මා මහරගම පිළිකා රෝහලේ ඉඳලා මේ ළඟදී ආවේ. පිළිකාව හොඳ නැහැ. අක්කලා දෙන්නෙක්, අයියලා දෙන්නෙක් හිටියා. ඒ ගොල්ලෝ බැඳලා. දැන් අපේ ගෙදරත් හත් දෙනෙක් ඉන්නවා. මම තමයි ඒ ගොල්ල ජීවත් කරවන්නේ."

මම කරන්නේ වැල්ලට ගිහින් ලෙලි තැලීම. ගෙදර ජීවත් කරන්න මම හම්බ කරන මුදල මදි. ඉතින් අපිට තිබුණා ආහාර මුද්දර පතක්. එක මුද්දරේකින් රුපියල් 15 ක බඩු ගන්න පුළුවනි. බුම්තෙල් ගන්න වෙන ම මුද්දරයක් තිබුණා.

මාගේ පළමු වැනිදා වෙන්නේ කවදද කිය කියා ඇඟිලි ගැන ගැන අපි ඉන්නේ. පළමු වැනිදා උදේ ම සමූපකාර කඩේ පෝලිමට යනවා. ඒ පෝලිමේ අපේ ගමේ දුප්පත් අය ඔක්කෝම ඉන්නවා. මුද්දර දීලා හාල් සීනි ගන්නවා. ආහාර මුද්දර හාල් ටික අපි දවස් දහයක්වත් කනවා. ඒක මොන කෑමක් ද කියලා හිතෙනවා. කනවා හෙවෙයි, නොමැරී ඉන්න ඔහේ මොනවාහරි බඩට දා ගන්නවා විතරයි.

මුද්දර පතක් තිබුණ අපිට දැන් ලැබෙන්නේ මුද්දර දෙකයි. පතක් කපලා. දැන් ඉතින් මොනවා කරනවද කියලා හිතාගන්න වත් මට බැහැ. දවල් දවසේ ම ලෙලි තළලා ගන්න කුලියයි, ආහාර මුද්දර පතයි අපේ පණ ගැට ගහ ගන්න උදව් වුණා. දැන් අපට මොකක් ද වෙන්නේ? මට බැහැ බැහැ තාත්තා ගේ ඇඟේ ලේ නැහැ. අම්මගේ ලේ හිඳිලා පිළිකාව. මුද්දර කැපිල්ලෙන් අපේ ඇඟේ තිබුණ ලේ ටිකත් හිඳිලා යනවා."

ඇය කෑ ගසා ඉකි ගසා හඬමින් කීවා ය.
එහි වූ බොහෝ මවුවරුන් ගේ කතා ඇගේ කතාවට සමාන විය.
"මින්න ජේනවතේ අපි නොකියපු එකකට උන්නැහෙලා ගැහුවා. අපි ගැහුවෙ උන්නැහෙල කියපුවට. එක වරක් කිව්ව අලියට ගහන්න කියලා, ගැහුවා. ඊළඟ කියාපි ලාම්පුවට ගහන්න කියලා. ගැහුවා. අපි කිව්වෙ නැහැ මුන්නැහේලාට හාල් පොකට ගහන්න කියලා. උන්නැහේල ගැහුවා. ආහාර මුද්දරේට ගහන්න කිව්වෙ නැහැ අපි. උන්නැහේලා ඒකටත් ගැහුවා.

මාසේ මුල් දවසේ සමූපකාර කඩවල තිබුණු ආහාර මුද්දර පෝලිම දැකපු මිනිසෙක් මේ මුද්දර කප්පාදුව අනුමත කරන්නේ නැහැ.

"දවසකට රුපියල් දාහකට වැඩිය ආදායම තියෙන බෝට්ටු අයිති මුදලාලිලාට ආහාර මුද්දර දීලා. බෝට්ටු වල කුලියට යන දුප්පතා ගේ මුද්දර කපලා. මුද්දර කපන්න ඉස්සර වෙලා නිලධාරි අපේ ගෙවල් වලට ආවෙ නැහැ. හිතුමතේට කපලා.

"මිනිස්සු පිස්සෝ වෙලා. දරු පවුල් පිටින් පාරට බැහැලා. මේකට විරෝධය පළ කිරීමට ඔවුන් සූදානම්." එච්. ඩී. සුනිල් නැමති ආහාර මුද්දර අහිමි වූ පියෙක් කීය. පනස් හැවිරිදි සිලිනෝනා මහත්මිය ගේ කතාවද හද කම්පා කරවයි.

"මගේ ස්වාමි පුරුෂයා මැලේ අවුරුදු තුනකට ඉස්සර. ඊට පස්සේ මමයි පුතයි, ගැහැණු ළමයි හතර දෙනයි රැක ගෙන ජීවත් වුණේ කොහොමද කියලා දන්නේ උඩ ඉන්න දෙයියෝ තමයි. උසස් පෙළ සාමාන්‍ය පෙළ විභාග පාස් වෙච්ච ළමයි ගිටියට උන්ට රස්සාවල් නැහැ. "ආහාර මුද්දර පතක් තිබුණා. කැපිල්ලෙන් පස්සේ එක මුද්දරය යි. මේ දරුවන් රැක බලා ගෙන ජීවත්වෙන්නේ කොහොමද කියලා හිතන්නවත් මට බැහැ. මේක නම් බෙල්ල කැපිල්ලක් තමයි."

ඇය සැමියාගේ මරණයෙන් පසු අවුරුදු 14 ක් තිස්සේ දරු පවුලක් නඩත්තු කිරීමට අනන්ත දුක් පීඩා විඳි ජේනෝනා මහත්මිය ගේ කතා පුවත ද දුක් මුසුය.

"මේක ණයකාර හිගන ජීවිතයක්. කොහු තළලා තමයි මම මේ දරු පවුල රැක ගත්තේ. ළමයි හතර දෙනා ගෙන් තුන් දෙනෙක් ඉස්කෝලෙ යනවා. එක ළමයෙක් මුදු යනවා. පසුගියදා බෝට්ටුව යට වෙලා තුවාල වෙලා ඒ ළමයා ගෙදර. මුද්දර අපිට සහනයක් වුණා. දැන් ඒක කපලා මට ඒක පේන්නේ බඩගින්නේ මැරියව් කියලා කිව්වා වගෙයි."
තලල්ලේ ලියනගේ පියසේන මහතා කීවේ ඔහු ගේ ආහාර මුද්දර තවයම කපා දැමුවේ දුව මැදපෙරදිග රටක රැකියාවට යාම නිසා බවයි.

"දුව රට යැව්වේ සියට දහයේ පොලියට රුපියල් 20,000 ක් ණයට අරගෙන. ඇය ඒ ණය ගෙවනවා. දුවට කොයි වෙලාවෙ එන්න වේද කියන්න ත් බැහැ. දුව නිසා තමුසෙගේ මුද්දර නැතිවුණා කියලයි අපිට කිව්වෙ."

දිළිඳු සහන රැක ගැනීමේ ව්‍යාපාරයේ සභාපති ඇල්පිටියේ අමුගොඩ අභිනවාරාමාධිපති දෙදියවල ආනන්ද හිමියෝ මේ සංවිධානය මඟින් රජයට කරුණු කීමටත් මුද්දර අහිමි වූ ජනතාව සංවිධානය කොට උද්ඝෝෂණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමටත් අදහස් කරන බව කීහ.
"ජනතාවට තව තවත් සහනාධාර අවශ්‍ය වෙලාවක් මේ. ජීවන වියදම වේගයෙන් ඉහළ යනවා. මේ දුප්පතුන්ට තිබුණු එකම ආදායම ආහාර මුද්දර. ඒකත් කපා දමා ඔවුන් ඉතා දුෂ්කර තත්වයකට හෙළා තියෙනවා.

"ආහාර මුද්දර හිමි වී සිටි ලක්ෂ ගණනක ජනතාවට ගැසූ මේ පහරට විරුද්ධව ජනතාව නැඟී සිටින බව පේනවා. ඔවුන් ගේ කෝපය පුපුරා යනවා. මේ දිළිඳු ජනතාව ගේ බතින් යැපුණු අපට ඔවුනගේ බඩට වදින විට පන්සලට වී ඉන්න බැහැ. අපත් ඔවුන් සමඟ පාරට බහිනවා."
දිළිඳු සහන රැක ගැනීමේ ව්‍යාපාරයේ ලේකම් එම්. ඩී ඩැනියෙල් මහතා කීවේ මේ දිළින්දන්ගේ මුද්දරය උදුරා ගැනීම සාහසික ක්‍රියාවක් බවයි.

දිවයින ඉරිදා සංග්‍රහය 1996 ජුනි 08